258, එම්. වින්සන්ට් පෙරේරා මාවත
කොළඹ 14
0114700800

# යුනිලිවර් සමාගම 11 වන වසරටත් ශ්‍රී ලංකාවේ ජනප්‍රියතම සේවායෝජකයා බවට තේරී පත්වේ

**කොළඹ, 8 May 2023:** යුනිලිවර් ශ්‍රී ලංකා සමාගම ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සිසුන් අතර සිදුකරන ලද සමීක්ෂණයක් මඟින් 11 වන වසරටත් දිවයිනේ ජනප්‍රියතම සේවායෝජකයා ලෙස පිළිගැනීමට ලක් කර ඇත. මෙම සම්මානය ශ්‍රී ලාංකීය තරුණ තරුණියන් අනාගත ව්‍යාපාර නායකයින් බවට පත් කිරීමේ අරමුණින් යුනිලිවර් සමාගම දරන ලද ප්‍රයත්නයන්හි ප්‍රතිඵලයක් ලෙස හැඳින්විය හැක.

කළමනාකරණ, විද්‍යා සහ ඉංජිනේරු විෂයයන් හදාරන රජයේ සහ පෞද්ගලික විශ්වවිද්‍යාල වල උපාධි අපේක්ෂකයින් සහභාගී කරගනිමින් Employer of Choice සමීක්ෂණය වාර්ෂිකව සිදු කරනු ලබයි. ඒ සඳහා සහභාගී වන්නන් විසින් දිවයිනේ ප්‍රමුඛ පෙළේ සමාගම් ඒවාට තාරුණ්‍ය සමඟ ඇති සබඳතාව, සපයනු ලබන වෘත්තීය අවස්ථා සහ තරුණ සේවා නියුක්තිය ඉහළ නැංවීම සඳහා කරන ලද ආයෝජන යන කරුණු මත පදනම්ව ශ්‍රේණිගත කරනු ලබයි.

මෙම ජයග්‍රහණය පිළිබඳව අදහස් දක්වමින් **යුනිලිවර් ශ්‍රී ලංකා සමාගමේ මානව සම්පත් අධ්‍යක්ෂිකා අනන්‍යා සභාර්වාල් මහත්මිය** මෙසේ පැවසීය. "ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සිසුන් විසින් අපව ජනප්‍රියතම සේවායෝජකයා ලෙස නැවත වරක් තෝරා පත් කර ගැනීම පිළිබඳව අපි නිහතමානීව සතුටට පත් වෙනවා. පිළිගත් පර්යේෂණ වලට අනුව 2030 වන විට Gen Z පරම්පරාව ලෝක ජනගහනයෙන් 30%ක් බවට පත්වන අතරම අනාගත ශ්‍රමබලකාය තුල ප්‍රධානතම කොටසක් වනු ඇති.. එබැවින් ඔවුන්ට අවශ්‍ය අවස්ථා ලබාදීම තුලින් පරිපූර්ණ Gen Z ප්‍රජාවක් ගොඩනැගීමට අපි අඛණ්ඩව කටයුතු කරනවා. ශ්‍රී ලංකාව පුරා සිටින තරුණ තරුණියන් සවිබල ගැන්වීමේ අපගේ මෙම ප්‍රයත්නයට සියලු ආකාරයන්ගෙන් සහය දැක්වූ විශ්වවිද්‍යාල, තරුණ ආයතන සහ සංවිධාන ඇතුළු අපගේ සහකරුවන් සියල්ලන් සමඟම මෙම ගෞරවනීය අවස්ථාව බෙදා ගැනීමට මා කැමතියි."

මේ පිළබඳව අදහස් දක්වමින් **යුනිලිවර් ශ්‍රී ලංකා සමාගමේ සභාපතිනී හා කළමනාකාර අධ්‍යක්ෂිකා හජාර් අලෆිෆි මහත්මිය** මෙසේ සඳහන් කළාය. "මෙම සන්ධිස්ථානය දශකයකට අධික කාලයක් පුරාවට ශ්‍රී ලාංකීය තාරුණ්‍යය සමඟ අපගේ ඇති සබඳතාවය පිළිබඳ කදිම සහතිකයක්. අපගේ තරුණ පරපුර අපගේ අනාගතය වන අතර වගකිවයුතු ආයතනික පුරවැසියෙකු ලෙස අප ඔවුන් සමඟ අත්වැල් බැඳගෙන සිටීම පිළිබඳව මම ආඩම්බර වෙනවා. අප ඔවුන්ගේ රැකියා සඳහා අවශ්‍ය කුසලතා සංවර්ධනයට පමණක් සීමා නොවී, ඔවුන්ව අනාගත ව්‍යාපාර නායකයන් ලෙස පුහුණු

කිරීමද සිදු කරනු ලබනවා. ඉදිරියටත් ඔවුන්ට ඔවුන්ගේ කුසලතා වර්ධනය කර ගැනීමට අවශ්‍ය අත්වැල සපයමින් යහපත් හෙටක් ගොඩනැගීම සඳහා අප ඇප කැපවී සිටිනවා."

2025 වන විට තරුණ තරුණියන් 100,000 ක පමණ ප්‍රමාණයක් රැකියා නිපුණතා අංශයෙන් සංවර්ධනය කිරීමේ අරමුණින් යුතුව යුනිලිවර් ශ්‍රී ලංකා සමාගම, එහි SPARKS ශිෂ්‍ය තානාපතිවරුන් සමඟ එක්ව ‘Future of Work’ තේමාව යටතේ මෙවරත් සිය වාර්ෂික තරුණ සංසදය (Youth Forum) පවත්වන ලදී. මෙවර එය පැවැත්වූයේ නවවන වරට වූ අතර උපාධි අපේක්ෂකයින් 400 කට ආසන්න සංඛ්‍යාවක් සහ 50ට අධික උපාධිධාරීන් පිරිසක් ඒ සඳහා සහභාගී විය. තවද යුනිලිවර් ශ්‍රී ලංකා සමාගම විසින් කැලණිය විශ්වවිද්‍යාලයේ (UoK) අලෙවි කළමනාකරණ අධ්‍යයනාංශය සමඟ 'උපායමාර්ගික හවුල්කරුවෙකු' ලෙස අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලද අතර CIMA ශ්‍රී ලංකා, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLIIT), ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (KDU) යන ආයතන සහ AIESEC Sri Lanka සහ Gavel clubs යන සමාජ සමඟ ද සහයෝගීතාවන්ට එළැඹ ඇත.

**- අවසන්-**

**ඡායාරූප සිරස්තල**

**පළමු ඡායාරූපය:** යුනිලිවර් ශ්‍රී ලංකා සමාගමේ මානව සම්පත් අධ්‍යක්ෂිකා අනන්‍යා සභාර්වාල් සහ යුනිලීවර් ශ්‍රී ලංකා සමාගමේ Employer Branding කණ්ඩායම සමඟ 2022 තරුණ සංසදයේදී යුනිලීවර් Sparks ශිෂ්‍ය තානාපතිවරුන්.

**දෙවන ඡායාරූපය:** යුනිලිවර් ශ්‍රී ලංකා සමාගමේ සාමාජිකයින් විශ්වවිද්‍යාල වල තාරුණ්‍යය කේන්ද්‍ර කොටගත් අවස්ථාවන්ට සහභාගී වෙමින්

**තෙවන ඡායාරූපය:** වමේ සිට දකුණට - සෞම්‍ය උදිත බණ්ඩාර ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සහ අධ්‍යක්ෂක – Centre for Brand Image Development (CBID), අලෙවි කළමනාකරණ දෙපාර්තමේන්තුව, වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය - කැලණිය විශ්වවිද්‍යාලය; ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නිලන්ති ද සිල්වා - උපකුලපති, කැලණිය විශ්වවිද්‍යාලය; අනන්‍යා සභාර්වාල් - මානව සම්පත් අධ්‍යක්ෂිකා, යුනිලිවර් ශ්‍රී ලංකා සමාගම; කේෂවි පුස්වැවල - Global Employer Brand Manager for Markets and Youth - Unilever ; මහාචාර්ය රවී දිසානායක - අංශ ප්‍රධාන, අලෙවි කළමනාකරණ දෙපාර්තමේන්තුව, වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය - කැලණිය විශ්වවිද්‍යාලය යන මහත්ම මහත්මීන් යුනිලිවර් ශ්‍රී ලංකා සමාගම සහ කැලණිය විශ්වවිද්‍යාලයේ අලෙවි කළමනාකරණ දෙපාර්තමේන්තුව අතර අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබූ අවස්ථාවේදී.

**සිව්වන ඡායාරූපය:** යුනිලීවර් තරුණ සංසදය (Unilever Youth Forum) 2022 සඳහා සහභාගිවූවන් සහ නිලධාරීන්ගේ සමූහ ඡායාරූපය.